අද 2020 02.27

පමිල පෙරේරා

# 2020 ජනවාරි උද්ධමනයේ ඉහළ යෑමක්

## - එළවළු, පොල්, රතුළූණු සහ මාළු මිල ඉහළ යෑම ආහාර කාණ්ඩයට බලපායි

**2020 ජනවාරි මාසයේ ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 7.6ක්%ක් බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පවසයි.**



පසුගිය දෙසැම්බර් මාසයේ වාර්තා වූ 6.2%ක මතුපිට උද්ධමනය සමග සැසඳීමේදී ජනවාරි මාසයේ උද්ධමනය ඉහළ යෑමක් දැකිය හැකි අතර, ආහාර කාණ්ඩයේ 6.0%ක සහ ආහාර නොවන කාණ්ඩයේ 1.7%ක දායකත්වය මෙම වැඩිවීමට බලපා ඇත.

2019 ජනවාරි මාසයට සාපේක්ෂව 2020 ජනවාරි මාසයේ ආහාර කාණ්ඩයේ ප්‍රතිශතය වැඩිවීමට ප්‍රධාන වශයෙන් එළවළු, පොල්, රතුළූණු, මාළු යන ආහාර ද්‍රව්‍යවල පැවැති ඉහළ මිල මට්ටමක් හේතු වූ අතර, 2019 අගභාගයේ පැවැති අයහපත් කාලගුණික තත්ත්වයේ බලපෑමෙන් ඇති වූ සැපයුම් හිඟවීම මීට ප්‍රධාන වශයෙන් හේතු වූ බව ශ්‍රී ලංකා මහ බැංකුව පවසයි.